# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1996 අංක 16 දරන

# දේශීය ආදායම්

# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1996 ජූලි මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1996 ජූලි මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ
**ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 1.50 ... තැපැල් ගාස්තුව : රු. 2.55 යි.

[සහතිකය සටහන් කළේ 1996 ජූලි මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 74/95

## 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ පනත 1996 අංක 16 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තියේ (ආ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1979 අංක 28 දරන පනතේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1). එම ඡේදයේ (Lxix) වන අනුඡේදයේ "ජපානයේ විදේශීය ආර්ථික සහයෝගතා අරමුදලේ ලාභ සහ ආදායම්." යන වචන වෙනුවට "ජපානයේ විදේශීය ආර්ථික සහයෝගතා අරමුදලේ ලාභ සහ ආදායම්;" යන වචන ආදේශ කිරීමෙන් ;

(2). එම ඡේදයේ (Lxx) වන අනුඡේදයේ "ලාභ සහ ආදායම්" යන වචන වෙනුවට "ලාභ සහ ආදායම්;" යන වචන ආදේශ කිරීමෙන් ;

(3). එම ඡේදයේ (Lxx) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේද ඇතුළත් කිරීමෙන් :-

"(Lxxi) ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 26 දරන ශ්‍රී ලංකා සේවා විසින් කළමනාකරණ ආයතන පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සේවා විසින් කළමනාකරණ ආයතනයේ ලාභ සහ ආදායම් ; සහ

(Lxxii) 1996 අංක 1 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ලාභ සහ ආදායම්".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (අඅ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(අආ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග 1995 නොවැම්බර් මස 8 වන දින හෝ ඉන් පසුව ගිවිසුම්කට ඇතුළත් වූ සමාගමක විෂයයෙහි, එම ගිවිසුමේ නියමයන්ට අනුව එම සමාගමේ ලාභ සහ ආදායම් ආදායම් බද්දෙන් නිදහස් වන්නා වූ කාල පරිච්ඡේදය තුළ හෝ ඊට පසු එක් වර්ෂයක් ඇතුළත, ආදායම් බද්දෙන් නිදහස් වන්නා වූ ලාභ සහ ආදායමෙන් එම සමාගමේ යම් කොටස්හිමියකුට බෙදා ලද යම් ලාභාංශයක්" ;

(ii) එම වගන්තියේ (ආ) ඡේදයෙහි "17ඒ, 18" යන ඉලක්කම් වෙනුවට "17 ඒ වන, 17බී වන සහ 18 වන" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන් ;

(iii) එම වගන්තියේ (ඇ) ඡේදයේ "(අ) හෝ (ආ) ඡේදයෙහි" යන වචන වෙනුවට "(අ) ඡේදයෙහි හෝ (අඅ) ඡේදයෙහි හෝ (අඅඅ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි" යන වචන ආදේශ කිරීමෙන් ;

(iv) එම වගන්තියේ (ඇඇ) ඡේදයේ "(අ) හෝ (ආ) ඡේදවල" යන වචන යෙදෙන කවර තැනෙක වුවද "(අ) ඡේදයෙහි හෝ (අඅ) ඡේදයෙහි හෝ (අඅඅ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි" යන වචන ආදේශ කිරීමෙන්

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (ත) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(තත) 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනතින් පිහිටුවනු ලද ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සලසා දෙනු ලැබූ හෝ ලබා දෙනු ලැබූ යම් ශ්‍රී ලාංකිකයකු වෙනුවෙන් 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී එකී කාර්යාංශය විසින් ලබාගත් මුදලේ [illegible] නොඉක්මවන කොටස";

(2) එම වගන්තියේ (ථ) ඡේදයේ "අර්ථානුකූල යම් ලාභ සහ ආදායම්; සහ" යන වචන වෙනුවට "අර්ථානුකූල යම් ලාභ සහ ආදායම්" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ (ථ) ඡේදයේ "මුදල්වල එකතු වන කොටස" යන වචන වෙනුවට "මුදල් මල එකතු වන කොටස ; සහ" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) එම වගන්තියේ (ථ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් ;

"(ද) ජාතික ලොතරැයි මණ්ඩලය මගින් පවත්වනු ලබන සංවර්ධන ලොතරැයියෙන් ලැබෙන ලාභ සහ ආදායම්."

ප්‍රධාන ප්‍රඥප්තියේ අලුතින් 17ඕ වගන්තිය ඇතුළත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 ඒ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 17 ඕ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

දියුණු තාක්ෂණය අත්කර ගන්නා සහ භාවිත කරන ව්‍යාපාරයක ලාභ සහ ආදායම් ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

17ඕ. (1) යම් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම හෝ සෑදීම සඳහා හෝ යම් සේවයක් සැපයීම සඳහා වූ ද (2) වන උපවගන්තියේ සඳහන් වන්නා වූ ද යම් ව්‍යාපාරයක නව ප්‍රාග්ධන වියදමට ආරෝපණය කළ හැකි ලාභ සහ ආදායම්, අදාළ දිනයෙහි සිට ගණන් බලනු ලබන අවුරුදු පහක කාල පරිච්ඡේදයක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන—

(අ) අදාළ දිනයෙන් ආරම්භ වන මාස 12 ක කාල පරිච්ඡේදයක් ඇතුළත දියුණු තාක්ෂණය අත්කර ගැනීම සහ භාවිත කිරීම සඳහා රුපියල් මිලියන දහයකට නොඅඩු නව ප්‍රාග්ධන වියදමක් දරා ඇත්තා වූ ද ව්‍යාපාරයක් ;

(ආ) තත් කාර්ය සඳහා 1996 සැප්තැම්බර් මස 30 වන දින හෝ ඊට පෙර ලියවිල්ලක් මගින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත, මේ වගන්තිය අදාළ වන ව්‍යාපාරයක් බවට 1997 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද ;

(ඇ) ඒ ව්‍යාපාරය විසින් අදාළ දිනයෙන් අවසාන වන වර්ෂය ඇතුළත සේවයේ නියුක්ත කරගනු ලැබූ සේවා නියුක්තයන්ගේ සාමාන්‍ය සංඛ්‍යාවට වඩා පනස් දෙනකුට නො අඩු සේවා නියුක්තයන් සංඛ්‍යාවක් අදාළ දිනයේ දී හෝ ඒ දිනයේ සිට මාස හයක් ඉකුත් වීමට පෙර සේවයේ නියුක්ත කරගන්නා වූ සහ, එකී සංඛ්‍යාවට එකී අවුරුදු පහක කාල පරිච්ඡේදය ඉකුත් වන තෙක් දිගටම සේවයේ නියුක්ත කර ගන්නා වූ ද;

යම් ව්‍යාපාරයකට අදාළ විය යුතු ය.

එසේ වුව ද (1) වන උපවගන්තියේ සඳහන් එකී අවුරුදු පහක කාලපරිච්ඡේදය ඇතුළත යම් තක්සේරු වර්ෂයක් තුළ දී, එම ව්‍යාපාරයේ සේවයේ නියුක්ත කරගෙන සිටින්නා වූ සේවා නියුක්තයන්ගේ සංඛ්‍යාව, එකී සාමාන්‍ය සංඛ්‍යාවට වඩා පණහකින් වැඩි නොවන අවස්ථාවක, ඒ ව්‍යාපාරයේ (1) වන උපවගන්තියේ සඳහන් පරිදි වූ එම ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් නොවිය යුතු ය.

මේ උපවගන්තියේ ''සේවානියුක්තයා'' සහ ''සාමාන්‍ය සංඛ්‍යාව'' යන යෙදුම්වල 16 ඇ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (iv) වන අනුඡේදයේ පිළිවෙලින් ඒවාට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා—

(අ) යම් තක්සේරු වර්ෂයකට සහ යම් ව්‍යවසායකට අදාළව ''නව ප්‍රාග්ධන වියදමට ආරෝපණය කළ හැකි ලාභ සහ ආදායම'' යන් යෙදුමින්-

(i) එම තක්සේරු වර්ෂයට අදාළ කළ හැකි ලෙස මේ ඡේදයේ උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති උචිත ප්‍රතිශතය අඩු කළ ඒ ව්‍යවසායේ එම තක්සේරු වර්ෂය සඳහා (යම් ප්‍රාග්ධන වත්කමක් විකිණීමෙන් හෝ යම් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය මිලට ගෙන නැවත විකිණීමෙන් ලැබුණු යම් ලාභ සහ ආදායම හැර) 3 වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූල වූ ලාභ සහ ආදායමෙහි,

(ii) එම ව්‍යවසාය අදාළ දිනයට පෙර අවුරුදු තුනක් හෝ ඊට වැඩි කාල පරිච්ඡේදයක් ව්‍යාපාරය කරගෙන ගොස් ඇති අවස්ථාවක අදාළ දිනයට පෙරාතුවම වූ අවුරුදු තුන සඳහා ගණන් බලන ලද නැතහොත්, එම ව්‍යවසාය අදාළ දිනයට පෙර අවුරුදු තුනකට අඩු කාලයක් ව්‍යාපාරය කරගෙන ගොස් ඇති අවස්ථාවක එසේ ව්‍යාපාරය කරගෙන ගිය මුළු කාල පරිච්ඡේදය සඳහා ගණන් බලන ලද ඒ ව්‍යවසායේ සාමාන්‍ය ලාභ සහ ආදායම් ඉක්මවන

අතිරික්ත ප්‍රමාණය අදහස් වේ.

එහෙත් එකී අතිරික්ත ප්‍රමාණය නව ප්‍රාග්ධන වියදමේ සහ අදාළ දිනයේ දී එම ව්‍යවසාය විසින් යම් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමට හෝ සෑදීමට හෝ යම් සේවා සැලසීමට හෝ භාවිත කරනු ලබමින් තිබුණු—

(i) යම් පිරියත, යන්ත්‍ර, සවිකිරීම් හෝ උපකරණ ; සහ

(ii) (යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් හැර) (i) වන අනුඡේදයේ සඳහන් නොවන යම් වත්කමක්

අත්කර ගැනීමේ අවස්ථාවේ දී වටිනාකමේ එකතුවට නව ප්‍රාග්ධන වියදම දරන අනුපාතයට වන අනුපාතයක් (යම් ප්‍රාග්ධන වත්කම්

විකිණීමෙන් හෝ යම් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය මිල දී ගෙන නැවත විකිණීමෙන් ලැබූ යම් ලාභ සහ ආදායම් හැර) (3)වන වගන්තියේ (අ) ඡේදයේ අර්ථානුකූලව එකී ව්‍යවසායේ එකී තක්සේරු වර්ෂය සඳහා වූ ලාභ සහ ආදායමට යම් මුදල් ප්‍රමාණයක් දරන්නේ ද එම මුදල් ප්‍රමාණයෙන් සියයට එකසිය විස්සක් නොඉක්මවිය යුතු ය:

එසේ වුව ද යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් (2) වන උපවගන්තියේ සඳහන් ව්‍යවසාය 17 වී වගන්තියේ විධිවිධාන අදාළ වන ව්‍යවසායක් ද වන අවස්ථාවක වැඩි සහනය සඳහා විධිවිධාන සලස්වන වගන්තියේ විධිවිධාන එම තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

උපලේඛනය

| | (සියයට) |
|---|---|
| අදාළ දිනය යෙදෙන තක්සේරු වර්ෂය ... (එම තක්සේරු වර්ෂය මේ උපලේඛනයේ "අදාළ වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලැබේ). | 10 යි |
| අදාළ වර්ෂයට ඉක්බිතිව එළඹෙන පළමු වන වර්ෂය | 10 යි |
| අදාළ වර්ෂයට ඉක්බිතිව එළඹෙන දෙවන වර්ෂය | 12. 5 යි |
| අදාළ වර්ෂයට ඉක්බිතිව එළඹෙන තුන්වන වර්ෂය | 15 යි |
| අදාළ වර්ෂයට ඉක්බිතිව එළඹෙන හතරවන වර්ෂය | 17. 5 යි |
| අදාළ වර්ෂයට ඉක්බිතිව එළඹෙන පස්වන වර්ෂය | 20 යි |

(අ) "අදාළ දිනය" යන යෙදුමෙන් 1995 නොවැම්බර් මාසයට පෙර නොවූ සහ 1997 අප්‍රේල් මාසයට පසු ව නොවූ යම් ලිත් මාසයක පළමු වන දිනය වූ ද එම ව්‍යවසාය විසින් තෝරා ගනු ලැබ එම මාසයේ අන්තිම දින සිට දින තිහක් ඉකුත්වීමට පෙර කොමසාරිස් ජනරාල්වරයා ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබුවා වූ ද දිනය අදහස් වේ :

එසේ වුව ද අදාළ දිනය එසේ කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දී නැති අවස්ථාවක, අදාළ දිනය 1996 අප්‍රේල් මස 1 වන දිනය ලෙස සැලකිය යුතු ය;

(ඇ) ''නව ප්‍රාග්ධන වියදම්'' යන යෙදුමෙන් ව්‍යවසාය විසින් දියුණු තාක්ෂණය අත්කර ගැනීම හා භාවිත කිරීම සඳහා යම් අලුත්—

(i) පිරියත, යන්ත්‍ර, සවිකිරීම් හෝ උපකරණ සහ

(ii) (යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් හැර) (i) වන අනුජේදයේ ඇතුළත් නොවූ වත්කමක්

මිල දී ගැනීමෙහි ලා ව්‍යවසාය විසින් දරන ලද වියදම් අදහස් වේ :

එසේ වුව ද අදාළ දිනයේ හෝ ඊට පෙර එම ව්‍යවසායේ වත්කම්වල කොටසක් වූ යම් පිරියත, යන්ත්‍ර, සවිකිරීම් හෝ උපකරණ අදාළ දිනයෙන් පසු ප්‍රතියෝජනය කිරීම සඳහා දරන ලද යම් වියදමක් නව ප්‍රාග්ධන වියදම් වශයෙන් නොසැලකිය යුතු ය.'

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 ඇඇඇඇ වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 ඇඇඇඇ වගන්තියේ ''ගණන් බලන ලද අවුරුදු පහක කාලයක් සඳහා'' යන වචන වෙනුවට ''ගණන් බලන ලද අවුරුදු හතක කාලයක් සඳහා'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (5) වන උපවගන්තියේ අතුරු විධානයේ ''අදාළ නොවිය යුතු ය.'' යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

''අදාළ නොවිය යුතු ය :

එසේම තව දුරටත් (අ) ඡේදයේ (i) අනුජේදයේ විධිවිධාන වල කිසිවක් ප්‍රාග්ධන වත්කම් කුලියට දීමේ ව්‍යාපාරයෙහි නිරත වූ සමාගමක් විසින් 1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු කුලියට දෙන ලද යම් ප්‍රාග්ධන වත්කමක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.''

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය (2) වන උප වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

''මේ ඡේදයේ කාර්ය සඳහා, 1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ''පොලිය'' යන යෙදුමෙන් පහත දැක්වෙන යම් කාර්යයක් සඳහා ලබාගත් ණයක් වෙනුවෙන් ගෙවන යම් පොලියක් අදහස් වේ :—

(i) යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ මිළ දී ගැනීම හෝ යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා යම් බිම් කොටසක් මිළ දී ගැනීම ;

(ii) යම් තීල ලැයිස්තු ගත පොදු සමාගමක යම් කොටසක් මිළ දී ගැනීම ;

(iii) යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රැකියාවක භාවිතය සඳහා යම් ප්‍රාග්ධන වත්කමක් අත්කර ගැනීම.”.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) (අඅඅඅඅ) ඡේදයේ “හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් පනස්දහසක දීමනාවක්, සහ” යන වචන වෙනුවට “හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් රුපියල් හැටදහසක දීමනාවක්;” යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ වගන්තියේ (අඅඅඅඅ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

“(අඅඅඅඅඅ) 1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් එක් ලක්ෂයක දීමනාවක්; හෝ”;

(ඇ) එම වගන්තියේ අතුරු විධානයේ—

“(අඅඅඅ) ඡේදයෙහි හෝ (අඅඅඅඅ) ඡේදයෙහි හෝ” යන වචන වෙනුවට “(අඅඅඅ) ඡේදයෙහි හෝ (අඅඅඅඅ) ඡේදයෙහි හෝ (අඅඅඅඅඅ) ඡේදයෙහි හෝ” යන වචන ආදේශ කිරීමෙන්.

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ—

(අ) ඒ උපවගන්තියේ පළමුවන අතුරු විධානයේ—

(i) (උ) ඡේදයෙහි “1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්” යන වචන හා ඉලක්කම් වෙනුවට “1995 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන්” යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ii) එම අතුරු විධානයේ (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

“(ඌ) 1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් එක් ලක්ෂයක දීමනාවක්.”.

(ආ) එම උප වගන්තියේ දෙවන අකුරු විධානයේ—

(i) එම අකුරු විධානයේ (ii) වන අනුච්ඡේදයේ "1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක රුපියල් හතලිස් දෙදහසකට ; සහ" යන වචන හා ඉලක්කම් වෙනුවට "1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක රුපියල් හතලිස් දෙදහසකට ; " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ii) ඒ අකුරු විධානයේ (iii) වන අනුච්ඡේදයෙහි "1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන විට රුපියල් හැටදහසකට" යන වචන හා ඉලක්කම් වෙනුවට "1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන විට රුපියල් හැට දහසකට ; සහ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(iii) ඒ අකුරු විධානයේ (iii) වන අනුච්ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුච්ඡේදය එකතු කිරීමෙන්.—

"(iv) ඒ තක්සේරු වර්ෂය 1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් වන විට රුපියල් එක් ලක්ෂයකට".

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (5) වන උප වගන්තියේ (ආ) ඡේදයේ "1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක්" යන වචන හා ඉලක්කම් වෙනුවට "1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1996 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (6ආ) උපවගන්තියේ—

"1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක්" යන වචන හා ඉලක්කම් වෙනුවට "1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1996 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(3) (5ඇ) උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උප වගන්තිය එකතු කිරීමෙන්—

"(5ඉ) 1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා —

(අ) සමාගමක් නොවන යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීම් —

(i) (2) වන උපවගන්තියේ (ආ), (ඇ), (ක), (ග) සහ (ට) ඡේදවල සඳහන් ගෙවීම් හැර ඔහු විසින් කරනු ලැබූ හෝ ඔහු විසින් කරනු ලැබුවේ යයි සැළකෙන සියලු සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් ඒ තක්සේරු කළ හැකි ආදායමෙන් තුනෙන් එකක් හෝ රුපියල් විසිපන් දහසක් යන දෙකින් කවර වූ හෝ අඩු මුදල නොඉක්මවිය යුතු ය ;

(ii) ඔහු විසින් කරනු ලැබූ හෝ ඔහු විසින් කරනු ලැබුවේ යැයි සැළකෙන (2) වන උපවගන්තියේ (ඇ), (ක) සහ (ග) ඡේදවල සඳහන් සියලු සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් රුපියල් විසිපන් දහසක් නොඉක්මවිය යුතු ය ;

(iii) ඔහු විසින් කරනු ලැබූ හෝ ඔහු විසින් කරනු ලැබුවේ යයි සැළකෙන (2) වන උපවගන්තියේ (ට) ඡේදයෙහි සඳහන් සියලු සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් ඒ තක්සේරු කළ හැකි ආදායමෙන් තුනෙන් එකක් නොඉක්මවිය යුතු ය ;

(iv) මේ උපවගන්තියේ (i) වන සහ (ii) වන ඡේදවල සඳහන් සියලු සුදුසුකම් ලබන ගෙවීම්වල සමස්තය සම්බන්ධයෙන්, රුපියල් විසි පන්දහසක් නොඉක්මවිය යුතු ය ;

(ආ) සමාගමක තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීමේ (2) වන උපවගන්තියේ (ආ), (ඇ), (ක) සහ (ග) ඡේදවල සඳහන් ගෙවීම් හැර, එම තක්සේරු වර්ෂයේ දී එම සමාගම විසින් කරන ලද හෝ එම සමාගම විසින් කරනු ලැබූවේ යයි සැළකෙන සියලු සුදුසුකම් ලබන ගෙවීම් සම්බන්ධයෙන් එම තක්සේරු කළ හැකි ආදායමෙන් පහෙන් එක් පංගුවක් නොඉක්මවිය යුතු ය ;

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධන කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (viii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :—

"(ix) 1996 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ IIඋ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව ; " :

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයේ —

(අ) එම අතුරු විධානයේ (1) වන අනුඡේදයේ "1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, රුපියල් හතලිස් දෙදහසක් ; සහ" යන වචන හා ඉලක්කම් වෙනුවට "1992 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1995 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, රුපියල් හතලිස් දෙදහසක් ;" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ අතුරු විධානයේ (vi) වන අනුඡේදයේ "1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් හැට දහසක්" යන වචන හා ඉලක්කම් වෙනුවට, "1995 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා රුපියල් හැට දහසක් ; සහ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ඇ) එම අතුරු විධානයේ (vi) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :—

"(vii) 1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධ යෙන් රුපියල් එක් ලක්ෂයක්" ;

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ—

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "ඒ මුදලෙහි රුපියල් පනස්දාස් ලක්ෂය ඉක්මවන්නා වූ යම් කොටසක් හැර, යම් මුදලක්; හෝ" යන වචන වෙනුවට, "ඒ මුදලෙහි රුපියල් පනස්ලක්ෂ ලක්ෂයක්; හෝ"

ඒ පුද්ගලයාට ඒ පාරිතෝෂිකය ගෙවන සේවා යෝජකයා යටතේ යම් සේවා නියුක්තියකින් විශ්‍රාම ලැබීමට පෙරාතුවම වූ අවුරුදු තුන තුළ දී ගෙවන ලද සාමාන්‍ය මාසික වැටුප හෝ වේතනය සේවා කාලයේ සම්පූර්ණ කළ අවුරුදු ගණනින් වැඩි කළ විට ලැබෙන ගණනට සමාන මුදලක් යන මේ කවර හෝ වැඩි මුදල ;

ඉක්මවන්නා වූ කොටස හැර යම් මුදලක්; හෝ ''

(ආ) ''1994 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන ඒ වගන්තියේ (viii) ඡේදයේ යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ 11ඊ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණය අනුව'' යන වචන හා ඉලක්කම් වෙනුවට, ''1994 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 1996 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුවම ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ 11ඊ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව; හෝ'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියේ (viii) වන ඡේදයට ඉක්බිතිව ම පහත දක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

''(ix) 1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ 11උ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් 32ඇඇඇ වගන්තිය ඇතුළත් කිරීම.

12. පහත දක්වෙන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඇ වගන්තියට ඉක්බිතිව ම මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඇඇඇ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය.:—

''ශ්‍රී ලංකාවේ සේවයේ යෙදී සිටින පුරවැසියකු නොවන තැනැත්තකුගේ සේවානියුක්තියෙන් ලැබෙන ලාභ මත, යම් නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා, ආදායම්

32 ඇඇඇ (1) 67 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ අවුරුදු තුනක කාලයක් නිර්වාසික වශයෙන් සළකනු ලබන පුද්ගලයකු එම කාලය ඉකුත් වීමෙන් පසුව ශ්‍රී ලංකාවේ දිගටම සේවයේ නියුක්තව සිටින අවස්ථාවක, ඒ අවුරුදු තුනක කාල පරිච්ඡේදයේ අවසානයෙන් ආරම්භ වන අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් සඳහා එම පුද්ගලයාගේ එම සේවා නියුක්තියෙන් ලැබෙන ලාභ, මේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇතද, සියයට පහළොවක අනු

(2) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ 1995 නොවැම්බර් මස 8 වන දින හෝ ඉන් පසුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති 11 වන වගන්තියේ (අඅ) ඡේදයේ අර්ථානුකූලව ප්ලැග්ෂිප් සමාගමක් වන සමාගමක සේවයේ යෙදී සිටින්නා වූ ද, 67 වන වගන්තියේ (7) වන උපවගන්තියේ අතුරු විධානය යටතේ අවුරුදු පහක කාලයක් නිර්වාසිකයකු වශයෙන් සලකනු ලබන්නා වූ ද පුද්ගලයකු, එම කාල පරිච්ඡේදය ඉකුත්වීමෙන් පසුව එම ප්ලැග්ෂිප් සමාගමේ දිගටම සේවයේ නියුක්තව සිටින අවස්ථාවක, එකී අවුරුදු පහක කාලපරිච්ඡේදයේ අවසානයෙන් ආරම්භව එම ගිවිසුමේ නියමයන් යටතේ එම ප්ලැග්ෂිප් සමාගමේ ලාභ සහ ආදායම නිදහස් කිරීම අවසාන වන දිනයෙන් අවසාන වන කාලපරිච්ඡේදය සඳහා ඒ පුද්ගලයාගේ එම ප්ලැග්ෂිප් සමාගමේ සේවා නියුක්තියෙන් ලැබෙන ලාභ සහ ආදායම, මේ පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇතද, සියයට පහළොවක අනුප්‍රමාණය මත ආදායම් බදු අය කරනු ලැබීමට යටත් විය යුතු ය,''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඉඉඉ වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඉඉඉ වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ ''1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක'' යන වචන හා ඉලක්කම් වෙනුවට, ''1995 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය වන අවස්ථාවක'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

''(ඈ) ඒ තක්සේරු වර්ෂය 1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් වන අවස්ථාවක සහ ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ අදාළ සේවා නියුක්ති ලාභ ප්‍රමාණය—

(i) රුපියල් එක් ලක්ෂ හතළිස් හතර දහස නොඉක්මවන අවස්ථාවක—

රුපියල් හාරදහස් අටසිය පණහක් හෝ

ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ අදාළ සේවා නියුක්ති ලාභවලට ආරෝපණය කළ හැකි ආදායම් බදු මුදල

යන දෙකෙන් කවර වූ හෝ අඩු මුදලට සමාන මුදලක් ;

(ii) රුපියල් එක් ලක්ෂ හතළිස් හතර දහස ඉක්මවන නමුත් රුපියල් එක් ලක්ෂ පණස් දහස නො

රුපියල් තුන්දහස් දෙසිය හතළිස් අටෙන්, ඒ පුද්ගලයාගේ ඒ තක්සේරු වර්ෂය සඳහා අදාළ සේවා නියුක්ති ලාභ එක්ලක්ෂ හතළිස් හතර දහස ඉක්මවන ප්‍රමාණයෙන් සියයට පණස් හතරක් අඩු කළ විට ලැබෙන මුදල ; හෝ

ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ පුද්ගලයාගේ අදාළ සේවා නියුක්ති ලාභවලට ආරෝපණය කළ හැකි ආදායම් බදු මුදල

යන දෙකෙන් කවර හෝ අඩු මුදලට සමාන මුදලක්".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඕ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඕ වගන් සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (i) වන උපවගන්තියේ (iii) වන ඡේදයේ "ඒ සමාගම විසින් පළමුව කී ලාභාංශ ල ... දින සිට එක් වර්ෂයක් ඇතුළත ගෙවන ලද්ද වූ ලාභාංශයක්" යන වචන වෙනුවට, "පළමුව සඳහන් ලාභාංශය දෙවනුව සඳහන් ලාභාංශය ලැබුණු යම් තක්සේරු වර්ෂයක් ඇතුළත හෝ ඊළඟ වර්ෂය ඇතුළත ගෙවනු ලැබුවේ නම් එම ලාභාංශය ;" යන වචන ආදේශ කිරීමෙන්,

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ—

(අ) ඒ උපවගන්තියේ (i) ඡේදයේ (අ) අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන්:—

"(අ) 32උ හෝ 32ඒ වගන්තිවල සඳහන් සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායමෙන් ; හෝ

32ක වගන්තියේ හෝ 32ග වගන්තියේ සඳහන් ලාභ සහ ආදායමෙන්

සියයට පහළොව ඉ අනුප්‍රමාණය අනුව බදු අයකළ හැකිවන්නේ යම් කාලසීමාවක් තුළ ද ඒ කාලය තුළ දී හෝ ඉනික්බිතිව එක් වර්ෂයක් ඇතුළත ගෙවනු ලබන ලාභාංශයක් ;".

(ආ) ඒ උපවගන්තියේ (iii) වන ඡේදයේ "ඒ සමාගම විසින් පළමු කී ලාභාංශය ලබාගත් දින සිට එක් වර්ෂයක් ඇතුළත ගෙවන ලද්ද වූ ලාභාංශයක්" යන වචන වෙනුවට, "පළමුව සඳහන් ලාභාංශය දෙවනුව සඳහන් ලාභාංශය ලැබුණු යම් තක්සේරු වර්ෂයක් ඇතුළත හෝ ඊළඟ වර්ෂය ඇතුළත ගෙවනු ලැබුවේ නම් එම ලාභාංශය "; යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 33අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (2) වන උප වගන්තියේ " 32ඊ වගන්තිය යටතේ හෝ 32උ වගන්තිය යටතේ හෝ 32ඔ වගන්තිය යටතේ " යන වචන හා ඉලක්කම් යෙදෙන සෑම තැනකම " 32ඊ වගන්තිය යටතේ හෝ 32උ වගන්තිය යටතේ හෝ 32ඔ වගන්තිය යටතේ හෝ 32ක වගන්තිය යටතේ හෝ 32ග වගන්තිය යටතේ " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (3) වන උප වගන්තියේ " 32උ වගන්තිය හෝ 32ඔ වගන්තිය " යන වචන හා ඉලක්කම් යෙදෙන සෑම තැනකම " 32උ වගන්තිය 32ඔ වගන්තිය, 32ක වගන්තිය හෝ 32ග වගන්තිය " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 33ඇ වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33ඇ වගන්තියේ (2) වන ඡේදය එම ඡේදයේ (ආ) අනුඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (ආ) (i) 32ඊ වගන්තිය යටතේ ;

(ii) 32උ වගන්තිය යටතේ ;

(iii) 32ඔ වගන්තිය යටතේ ;

(iv) 32ක වගන්තිය යටතේ ;

(v) 32ග වගන්තිය යටතේ ;

(vi) මේ පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයන් නොවන අනුප්‍රමාණයන් අනුව බදු අය කළ හැකි ලාභ සහ ආදායම් ; සහ ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ (2අ) උප වගන්තියේ (iii) වන ඡේදයේ " 32උ වගන්තිය යටතේ හෝ 32ඔ වගන්තිය යටතේ වූ බද්ද සම්බන්ධයෙන් " යන වචන හා ඉලක්කම් වෙනුවට " 32උ වගන්තිය යටතේ හෝ 32ඔ වගන්තිය යටතේ හෝ 32ක වගන්තිය යටතේ හෝ 32ග වගන්තිය යටතේ වූ බද්ද සම්බන්ධයෙන් " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (1අ) උප වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උප වගන්තියේ (iv) වන ඡේදයේ " ආරම්භක වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් හැට දහසක්, " යන වචන වෙනුවට " ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා රුපියල් හැට දහසක් ; සහ " යන වචන ආදේශ කිරීමෙන් ;

(ඩ) ඒ උප වගන්තියේ (vi) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

" (vii) 1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් එක් ලක්ෂයක්."

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තියේ (2අ) උප වගන්තියේ " තක්සේරු වර්ෂයේ අවසානයේ සිට දින තිහක් ඇතුළත තක්සේරුකරුවකු විසින් " යන වචන වෙනුවට " තක්සේරු වර්ෂයේ අවසානයේ සිට දින තිහක් ඉකුත් වීමට පෙර තක්සේරුකරුවකු විසින් " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තිය සංශෝධනය කිරීම.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වන වගන්තියේ (1) වන උප වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (1) (අ) මාසයකට රුපියල් අට දහස් තුන්සිය තිස් අූනකට හෝ වර්ෂයකට රුපියල් එක් ලක්ෂයකට වැඩි පාරිශ්‍රමිකයන් ලබන යම් පුද්ගලයකු ; හෝ

(ආ) ශ්‍රී ලංකාවෙහි කරනු ලබන සේවය වෙනුවෙන් මාසයකට රුපියල් අසූ පහකට හෝ වර්ෂයකට රුපියල් එක් දහසකට වැඩි පාරිශ්‍රමිකයන් ලබන නිර්වාසික පුද්ගලයකු,

සේවයෙහි නියුක්ත කරන්නා වූ ද, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 107ඇ වගන්තිය යටතේ හෝ මේ පනතේ මේ පරිච්ඡේදය යටතේ හෝ කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම්දීමක් කර නොමැත්තා වූ ද සෑම සේවායෝජකයකු විසින්ම, (මේ පරිච්ඡේදයේ මින් මතු " නියමිත සේවා නියුක්තයා " යනුවෙන් සඳහන් කරනු ලබන) එවැනි යම් පුද්ගලයකු තම සේවයෙහි සිටින බව, 1996 සැප්තැම්බර් මස 30 වන දින ඉකුත්වීමට පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දීම කළ යුතු ය."

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඔ වගන්තියේ (2) වන උප වගන්තියේ (අ) ඡේදයේ (1) අනුඡේදයෙහි වූ " එකතුව රුපියල් තිස් දහසකට නොඅඩු නිශ්චිත ගාස්තුවක් ;" යන වචන වෙනුවට " රුපියල් තිස් දහසකට නොඅඩු නිශ්චිත ගාස්තුවක් හෝ එකතුව රුපියල් තිස්දහසකට නොඅඩු වන නිශ්චිත ගාස්තු ; " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඔ වගන්තිය සංශෝධනය කිරීම.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඩ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.— ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඩ වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ — "1995 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන්" යන වචන හා ඉලක්කම් වෙනුවට "1995 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන්" යන වචනය ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"(ඈ) 1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධ

යෙන් වන විට ඒ සේවානියුක්තයාගේ එකී පඩිනඩිවලින් රුපියල් එක් ලක්ෂයක් අඩු කිරීමෙන් පසු මේ පනතේ පළමුවන උපලේඛනයේ II උ කොටසේ නිශ්චිතව සඳහන් අනු ප්‍රමාණ අනුව ඒ මත ගණන් බලන ලද ආදායම් බද්ද විය යුතු ය".

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1). ඒ උපලේඛනයේ IIඊ කොටසේ "1994 අප්‍රේල් මස 1වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ" යන වචන හා ඉලක්කම් වෙනුවට "පිළිවෙළින් 1994 අප්‍රේල් මස 1 වන දින සහ 1995 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂ දෙක සඳහා ආදායම් බදු අනුප්‍රමාණ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2). එම උපලේඛනයේ IIඊ කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"II උ කොටස

1996 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු ය.—

| | |
|---|---|
| බදු අයකළ හැකි ආදායමේ පළමු රු. 35,000 මත | සියයට 10 |
| බදු අයකළ හැකි ආදායමේ ඊළඟ රු. 35,000 මත | සියයට 15 |
| බදු අයකළ හැකි ආදායමේ ඊළඟ රු. 35,000 මත | සියයට 25 |
| බදු අයකළ හැකි ආදායම් ශේෂය මත | සියයට 35". |

ප්‍රධාන ප්‍රඥප්තියේ හත්වන උපලේඛනය සංශෝධනය කිරීම.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ හත්වන උපලේඛනයේ "32ඔ වගන්තියේ හෝ 33ක වගන්තියේ" යන වචන සහ ඉලක්කම් ඇති සෑම තැනකම ඒ වෙනුවට "32 ඔ වගන්තියේ හෝ 32ක වගන්තියේ හෝ 32ඛ වගන්තියේ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අතීතයට බලපෑම.

25. (1) මේ පනතේ 4 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට කර ඇති සංශෝධනය 1990 අප්‍රේල් මස 1 වන දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

(2). මේ පනතේ 7 වන වගන්තියෙන්, ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියට කර ඇති සංශෝධනය 1995 අප්‍රේල් මස 1 වන දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

(3) මේ පනතේ 13 වන, 14 වන, 15 වන, 16 වන සහ 23 වන වගන්තිවලින් ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඕ, 33අ, 33ඇ, 38 වන වගන්තිවලට සහ හත්වන උපලේඛනයට කර ඇති සංශෝධන 1994 ඔක්තෝබර් මස 31 වන දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතුය.

(4) මේ පනතේ 20 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 113ඔ වගන්තියට කර ඇති සංශෝධනය 1992 නොවැම්බර් මස 18 වන දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

25. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත [illegible] දෙසැම්බර් මස 15 වැනි දිනට දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.